# කාර්ය පත්‍රිකාව

1. පන්තිය : 8 ශ්‍රේණිය විෂය : විද්‍යාව අදාල සතිය : 04 සතිය සැප්තැම්බර්

2. ඒකකය : 11 ශාක වල ප්‍රධාන ජෛව ක්‍රියාවලි

## 3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

I. දිවා කාලයේදී ශාක අත්තක් විනිවිද පෙනෙන පොලිතීන් බෑගයකින් ආවරණය කර පැයකට පමණ පසු නිරීක්ෂණය කර අදාල නිරීක්ෂණ සටහන් කර ගන්න.

II. පෝච්චියක සිට වූ විසිතුරු හබරල / ඇන්තූරියම් පැලයක් රාත්‍රී කාලයේදී නිවස තුල තබා පසුදා උදෑසන එම ශාක වල පත්‍ර නිරීක්ෂණය කර අදාල නිරීක්ෂණ සටහන් කර ගන්න.

III. උත්ස්වේදනය අඩු කිරීමට, ආහාර සංචිත කිරීමට හා ප්‍රචාරණයට ශාක වල පත්‍ර වල විවිධත්වය, කඳන් වල විවිධත්වය , මුල් වල විවිධත්වය පිළිබඳව නිරීක්ෂණය කොට වාර්තාවක් සකස් කරන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, **websites, LMS** පාඩම් හා වෙනත් ඉගෙනුම් ආධාරක **(online, offline, printed)** :

I. **e -නැණපියස:**

- https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=26401
- https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=26403

II. **e -තක්සලාව:**

- https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=42744
- https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=42745
- https://www.e-thaksalawa.moe.gov.lk/moodle/pluginfile.php/243790/mod_resource/content/1/8%20%E0%B7%81%E0%B7%8A_%E0%B6%BB%E0%B7%9A%E0%B6%AB%E0%B7%92%E0%B6%BA%20%E0%B6%B4%E0%B7%8F%E0%B6%A9%E0%B6%B8%2011.pdf

III. **Youtube:**

- https://www.youtube.com/watch?v=2zOE1SplUHw&t=1193s
- https://www.youtube.com/watch?v=UYoVdDmfy5w&t=412s

## 5. මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

I. ශාක වල විවිධත්වයට තුඩු දෙන අනුවර්තන පැහැදිලි කරයි.

II. ශාක වල ප්‍රධාන කොටස් වල අනුවර්තන ඒවායේ සුවිශේෂ කෘත්‍ය වලට සම්බන්ධ කිරීම අරමුණු කර ගනිමින් පරිසරය විමර්ශනය කරයි.

III. උත්ස්වේදනයේ වැදගත්කම පිළිගනියි.

IV. බිංදුදය හා උත්ස්වේදනය අතර වෙනස හඳුනා ගනී.

V. ශාක වල උත්ස්වේදනය පෙන්වීම සඳහා සරල ක්‍රියාකාරකම් නිර්මාණය කරයි.

6. **ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය** :




1) උත්ස්වේදනය බහුලව සිදුවන ශාක වල ව්‍යුහය කුමක්ද?

2) උත්ස්වේදනය නිසා ශාකයට ඇති වාසි මොනවාද?

3) උත්ස්වේදනය සඳහා බලපාන පාරිසරික සාධක මොනවාද?

4) ශුෂ්ක පරිසර තත්ව වලදී ජල සංරක්ෂණය සඳහා ශාක පෙන්වන අනුවර්තන උදාහරණ සහිතව පෙන්වන්න.




පෙළ පොතේ 11.6 ප්‍රායෝගික පරීක්ෂණය හොඳින් අධ්‍යනය කරන්න.

1) "U" නළයේ නිදහස් බාහුවට සවි කර ඇති පිපෙට්ටුවේ ජල මට්ටමට සිදු වන්නේ කුමක්ද?

2) ඊට හේතුව කුමක්ද?

3) "U" නළයේ නිදහස් බාහුවට සවි කර ඇති පිපෙට්ටුවේ ජල මට්ටමට සිදු වන්නේ කුමක්ද?

4) ඊට හේතුව කුමක්ද?